# හිතාදර නායක කුමාර සංගක්කාර වෙත,

පසුගියදා එංගලන්තයේ පැවැත් වූ 20 යි 20 ලෝක කුසලාන තරඟාවලිය නිමාවට පත්විය. එහි ලෝක ශූරතාවය දිනාගත්තේ පකිස්ථානයයි. අනු ශූරයන් ලෙස අවසාන මහා තරඟයෙන් පරාජය වුයේ ශ්‍රී ලංකාවය. දැන් එය ඉතිහාසයට එක්වී හමාරය.

කෙසේ වෙතත් අනුශූරයන් ලෙස ජයග්‍රාහී ගමනක් ගිය මෙම තරඟාවලිය ගැන යම් සටහනක් තැබිය යුතු වන්නේ ප්‍රධාන කරුණු දෙකක් හේතු කොටගෙනයි. කුමාර් සංගක්කාර නායකයකු ලෙස සහභාගී වූ ප්‍රථම සංචාරය මෙය වන්නේය. එමෙන්ම ශ්‍රී ලංකා කණ්ඩායමෙන් ලෝක කුසලානය ගිලිහී ගියේ කුමන හේතුවක් නිසාවෙන්ද? මෙම කරුණ විමසා බැලීමේදී තරඟා වලියේ අප ආ ගමන් මඟ ගැන හැරී බැලීම වැදගත්ය. ප්‍රබල ඕස්ට්‍රේලියාව බටහිර ඉන්දීය කොදෙවු දුපත් පකිස්ථානය නවසීලන්තය වැනි රටවල් පරාජය කරමින් අපරාජිතව අවසන් මහා තරඟය දක්වා පැමිනීමට ප්‍රධානත්වයෙන් උපකාරී වුයේ ශ්‍රී ලංකා පන්දු යවන්නන්ගේ දක්ෂ පන්දු යැවීම බව ඕනෑම කෙනෙක් අවිවාදයෙන් පිලිගන්නා කරුණකි. ශ්‍රී ලංකා පිතිකරුවන් ලකුණු 150 ක් ලබා දෙන්නේ නම් ඔවුන්ට තරඟය ජය ගෙන දිය හැකි බව එක වරක් නොව සිවුවරක් ඔවුන් සනාත කර පෙන්වන ලදී. තරඟාවලියෙදී ලෝක ප්‍රකට විස්තර විචාරකයන් ද ශ්‍රී ලංකා පන්දු යවන්නන් හැදින්වුයේ යනුවෙනි. එසේ නම් අවසන් මහා තරඟායේදී ලකුණු 150 වත් ලබා ලබාගැනිමට නොහැකි වීම පරාජයට ප්‍රධාන හේතුව නොවන්නේද? ලකුණු ලබාගැනිමට හැකි දක්ෂ මැද පෙල පිතිකරුවන් කණ්ඩායමට ඇතුලත් කර සිටියේද ? ශ්‍රී ලංකා කණ්ඩායමේ ක්‍රිඩාකල මැද පෙල පිතිකරුවන් ශ්‍රී ලංකාවේ සිටි දක්ෂම පිතිකරුවන්ද ? නියත වශයෙන් නැත.

හිතාරද අලුත් නායකතුමනි, පලමු තරඟාවලියෙන්ම අවසන් මහා තරඟයට දක්වා තම කණ්ඩායම මෙහෙයවීම අපි ඉහළින්ම අගය කරමු. එහෙත් ඔබේ කණ්ඩායමේ සිටියේ වැඩකට නැති මැද පෙල පිතිකරුවන් බව හෘදය සාක්ෂියට එකඟව ඔබ පිලිගත යුතුය. දිගු ගමනක් යාමට ඇති ඔබට ගමන ආරම්භයේදී ම තේරීම් කමිටුව නිසි මගකට යොමු කිරීමේ පරම වගකීම පැවරී ඇත. කිසි විටකත් ඔබ තේරීම් කමිටුවේ එහෙයියන් නොවිය යුතුය. අවසන් මහා තරඟයෙන් පසු ඔබ විසින් කරන ලද කතාවේදී චාමර සිල්වා ගැන විශේෂයෙන් සදහන් කිරීම ඔවුන්ට උඩගෙඩි දීමක් දැයි අපට සිතුනි. තරඟාවලිය පුරාම ලකුණු අතර සිටියේ ක්‍රිඩකයින් දෙතුන් දෙනෙක් පමණී. එයිනුත් තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස කිරුල පැලදි තිලකරත්න ඩිල්ෂාන් කීප විටක්ම දැක් වු දක්ෂකම් නොවන්නට මෙතරම් දුර ගමනක් යාම සිහිනයක් වනු ඇත. තරඟාවලියේ ඔහු දැක්වු චමත්කාර පිතිහරඹය ක්‍රිඩාලෝලීන් කලකට අමතක නොකරනු නොඅනුමානය. ඔහු ඇරුනු කොට විටක තුන ඉරියව්වෙන්ම කැපී පෙනෙන ඇන්ජලෝ මැතිවුස් හැරුනු කොට ඒ අය අසාර්ථක වු විටක පිල ගොඩ ගැනිමට (ලකුණු අතරට ඒමට) ක්‍රීඩකයෙක් කන්ඩායමේ නොසිටියේ ඇයි. එම දෙයට ඔබත් තරමක වගකිය යුත්තෙක් බවට මතක් කර දෙනු කැමැත්තෙමි. මුබාරක් පසුගිය වසර 7 අටක කාලයත් තුල ශ්‍රී ලංකාව වෙනුවෙන් වගකීමකින් ගොඩනැගූ එකම එක ඉනිමක්වක් අප මතකයට නොහැගේ. එවැනි ක්‍රීඩකයෙක් කණ්ඩායටම ඇතුල් වුයේ කෙසේද ? එය තේරීම් කමිටුවේ ගිනුමට බැරකල හැකිය. එහෙත් අවසන් මහා තරගයේදී පකිස්ථාන ප්‍රබල පන්දු යැවිම ඉදිරියේ කණ්ඩායමේ වටිනාම විකට්ටුව වන ඩිල්ෂාන් දැවී යාමෙන් පසු තුන්වැනි විකට්ටුව වෙනුවෙන් මුබාරක් වැනි වගකීමකින් තොර පහර දෙන පිතිකරුවකු කැදවීමේ වගකීම ඔබ සතුය. චාමර සිල්වා කලට පෙර හොද ඉනිම් කීපයක් ක්‍රීඩාකර අති බව අපි දනිමු. එහෙත් ගතවු වසර දෙක ඇතුලත ඔහු දිගින් දිගටම අසාර්ථක වු බව අපට වඩා හොදින් ඔබත් තේරීම් කමිටුවත් දන්නා කරුණකි. ඔවුන් දෙදෙනාටම වඩා වටිනා ක්‍රිඩකයින් ශ්‍රී ලංකාවේ නොව ක්‍රීඩා විවේකාගාරයේ තුලද සිටි බව සැඟවීමට කිසිවකුටත් නොහැකිය. ඉන්දික සේරම් 20 යි 20 අන්තර් ක්‍රිඩා සමාජ තරඟා වලියේ වැඩිම ලකුනු ලබාගත් ක්‍රිඩකයා පමණක් නොව වැඩි වේගයකින් ලකුණු ලබා ගැනිමට හැකි ශ්‍රී ලංකාවේ ක්‍රිඩකයින් කීපදෙනගෙන් කෙනෙකි. එමෙන්ම මහරුෆ් බොහෝ අවස්ථාවල ශ්‍රී ලංකාවේ ජයග්‍රහනය වෙනුවෙන් කැපවු ඉතා හොඳ ජාත්‍යන්තර පලපුරුද්දක් ලබා ඇති ක්‍රිඩකයෙකි. ඔවුන් රැගෙන ගියේ විනෝද චාරිකාවකි සදහා විය නොහැකිය. වසර ගනනාවක් මැල් හීතිකාවට ලක් වි ඇති ශ්‍රී ලංකා කණ්ඩායම නැවත වරක් ලෝක කුසලාන තරගාවලිය අප සිහියට නැගෙන්නේ නිතැතින්ය. එදා මාවන් අතපත්තු ක්‍රිඩාගාර අඩස්සියේ තැබුවා මෙන් මෙදා ඉන්දික සේරම් හා මහරුෆ්ට එම ඉරණම අත් වි ඇති බව දක්නට ලැබීම අවාසනවකි. හිතවත් කැප්ටන් තුමනි ඔබට මෙවැනි දේශපාලන කාරිය හා පක්ෂ ග්‍රාහී වු තේරීම් කමිටුවකට එරෙහිව නැගී සිටිය හැකි පෞරුෂයක් ඇති බව අපි තරයේ විශ්වාස කරමු. ඒ නිසා ලිපිය ආරම්භයේදීම තේරීම් කමිටුවේ එහෙයියකු නොවන මෙන් අප ඔබෙන් ඉල්ලා සිටින්නෙමු. එමෙන්ම හොද හෝ නරක ක්‍රිඩකයන් නොව තමන්ට කැමති ක්‍රිඩකයින් පමනක් ශ්‍රී ලංකා කණ්ඩායමට ක්‍රීඩා කිරිමට ඉඩ සලසා දෙන අර්ජුන ප්‍රතිපත්තියද අනුගමනය නොකරන මෙන් ද අප ඔබෙන් ඉල්ලා සිටිමු.

තවද ශ්‍රී ලංකා කණ්ඩායමේ නායකයා ලෙස ඔබ ඉංග්‍රිසි භාව චතුර ලෙස කතාකිරීම අපි අගය කරමු. එය අපට ගෞරවයකි. තරගයක් ආරම්භයේදී හා අවසානයේයදී ඔබ දක්වන අදහස් මුලු මහත් ලෝකවාසී ක්‍රිඩාලෝලීන් ඉතා සංවේදීව ග්‍රහනය කරගන්නා බව ඔබට කිවයුතු නොවේ. මහේල එම කාර්යය ඉතා නිහතමානිව අවශ්‍ය කරන කරුණක් ඇතුලත්ව කල නායකයෙකු ලෙස අප මතකයේ රැදී ඇත. ඔබෙන්ද ඉදිරියේදි අප බලාපොරොත්තු වන්නේ එයයි. 20 යි 20 අවසාන මහා තරගෙයෙන් පසු ඔබ විසින් කරන ලද කෘතවේදී ජයග්‍රහනය කල අප අසල්වැසි සහෝදර රටක් වන පකිස්ථානයට සුභ පැතීමට ඔබ අමතක කල බව කිවයුතුය. ඒ වෙනුවට ඔබ ඔවුන්ව නැවත වරක් ශ්‍රී ලංකාවේ හමුවන බව ප්‍රකාශ කරන ලදී. කරුණු කොහොම උනත් එවැනි කුඩා දෙයක් නිවැරදිව ඔබෙන් සිදුවිය යුතුයයි ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම ක්‍රීඩා ලෝලීන් ඔබෙන් බලාපොරොත්තු වීමට සුවිශේෂ හේතුවක් ඇති බව ද ඔබට මතක් කර දෙනු කැමැත්තෙමි. ලෝක වාසී ක්‍රීඩා ලෝලීන්ගෙ" හදවත් තුල ජිවත් වන ලෝක ප්‍රජිත ක්‍රිකට් ක්‍රීඩකයෙකු ලෙස කුමාර සංගක්කාර ක්‍රීඩා ලොව ජයගෙන තිබීම ඊට හේතුවයි. ඔබට ලැබෙන විවේචන අපහසුවෙන් ඉවසා වදූරා ඉන් උගත හැකි යමක් ඇත්නම් ඒ ගැන පමනක්ම අවධානය යොමු කරමින් ඔබ යන ජය මාවතේ තව තවත් ඉදිරියට යන්නට ශක්තිය ධෛර්‍ය හා වාසනාව අපි ප්‍රාර්ථනා කරමු.




- අසෝක සිල්වා -